පුවත්පත් කලාවේදියෙකු දැන දැනම හෝ හිතාමතා හෝ ජනවාර්ගික හෝ ආගමික අසමගියට හෝ ප්‍රචණ්ඩත්වයට අනුබල නොදිය යුතු බව ජනමාධ්‍ය ආචාර ධර්මයකි. එසේ තිබියදී නිශ්චිත මූලාශ්‍රයන්ගෙන් තොරව, "ප්‍රදේශවාසියෙකු" උපුටා දක්වමින් "...කිහිප දෙනෙකුම මේ වනවිට රෝගී තත්වයේ පසුවන බවත්, එසේ නිවැරදි තතු හෙළි නොකිරීම තම ආගමට අයත් වූවන්ගේ ගතියක් බව පවසයි" යනාදී වශයෙන් වන ප්‍රකාශයක් පුවත්පතක පළ කළ හැකිද?
මේ අරුණ පුවත්පතේ පළවූ ලිපියක එන කොටසකි. මෙවන් ප්‍රකාශයන් ඔස්සේ සිදුවන්නේ කොවිඩ්19 වසංගත රැල්ල අතරේ, වර්ගවාදී අසමගියක රැල්ලකටද අනුබල ලැබීම නොවේද? එය ජනමාධ්‍ය ආචාර ධාර්මික උල්ලංඝනයක් නොවේද?

#MediaEthicsSL #Sinhalapapers #lka #Aruna